***ISBN 978-955-4563-72-8***

# ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් අනුගමනය කරන ලද ශාසනික ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයනයක්

**ඊ.ඩබ්ලිව්.ඒ. හසිත චාමිකර ගුණසිංහ**

**ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**

## සංක්ෂේපය

***ක්‍රි.පූ. තුන්වන සියවසේ සිදු වූ මහින්දාගමනයෙන් මෙරට ස්ථාපිත කෙරුණු බුදුසසුන ක්‍රමයෙන් රාජ්‍යත්වය සමග අවිච්ඡින්න සබඳතාවක් පවත්වන්නට විය. මෙනිසා ලක්දිව රජු අනිවාර්යයෙන්ම බෞද්ධයෙකු වී, බෞද්ධ පාලන ප්‍රතිපත්තිවලට අනුකූලව පාලනය ගෙනයාමට බැඳී සිටියේ ය. රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමේ කාර්යය හිමිකරගත් භික්ෂූන් වහන්සේ පසු කලෙක ඉන් ඔබ්බට යමින් විටෙක රජුන් තැනීමට ද, තවත් විටෙක රජුන් විනාශ කිරීමට ද මුල් වූ බව පෙනේ. ඉන් තහවුරු වූයේ රාජ්‍ය දේශපාලනය කෙරෙහි භික්ෂූන් වහන්සේ සතු වූ අධිකාරී බලයයි. එම තත්ත්වය තුළ රාජ්‍ය පාලනය ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වූ භික්ෂූන් වහන්සේගේ සහය රජවරුන් ලබාගත්තේ බුදුසසුනට සහ භික්ෂූන් වහන්සේට අනුග්‍රහ දැක්වීම මගිනි. එය උඩරට රාජධානියේ පාලකයන්ව සිටි උපතින් හින්දු භක්තික නායක්කර් වංශික රජවරුන්ගේ පාලනයේදී පවා නොවෙනස්ව දැකගත හැකිය. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වූයේ උපතින් හින්දු භක්තිකයෙකු වූ නායක්කර් වංශික ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් අනුගමනය කරන ලද ශාසනික ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයනය කිරීමයි. එහිදී රජු විසින් කවර අන්දමේ ශාසනික සේවාවක්, කිනම් අංශ යටතේ සිදුකළේ ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටළුව විය. මේ පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් මූලාශ්‍රය අධ්‍යයනය යොදාගැනුණු අතර සාහිත්‍ය මූලාශ්‍රය සහ පුරාවිද්‍යා මූලාශ්‍රය එහිදී අධ්‍යයනය කෙරිණි.මෙම අධ්‍යයනයේදී පැහැදිලි වූයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලය තුළ අර්බුද පැවතිය ද, පෙර රජුන් සේම බුදුසසුන සහ භික්ෂූන් වහන්සේ උදෙසා රජු අනුග්‍රහ දක්වා ඇති බවයි. එහිදී රජුගේ මැදිහත් වීම දළදා වහන්සේට පුද සත්කාර කිරීම, වෙහෙර විහාර පිළිසකර කිරීම හා ගම්වර පූජා කිරීම, ශාසනික ගැටළු විසඳීම ආදී අංශ කෙරෙහි ලැබී තිබුණු බව පෙනේ. එහෙත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ප්‍රතිපත්ති මුල් පාලන කාලයට සාපේක්ෂව, අවසන් කාලසීමාව වන විට ශාසනපීඩක සහ ප්‍රජාපීඩක වී ඇති බව මූලාශ්‍රය පරිශීලනයේදී එළඹුණු නිගමනයකි.***

***මුඛ්‍ය පද : ශ්‍රී වික්‍රම රාජසිංහ, උඩරට රාජධානිය, ආගමික සේවා, භික්ෂූන් වහන්සේ, දළදා වහන්සේ***

## හැඳින්වීම

මෙරට බුදුසසුන මැනවින් ප්‍රතිෂ්ඨාපනය වූයේ අනුරාධපුර රාජධානි සමයේ දෙවනපෑතිස් රජ දවස (ක්‍රි.පූ. 307-267) සිදුවූ මහින්දාගමනයත් සමග ය. ඒ අවස්ථාවේදී දෙවනපෑතිස් රජු බෞද්ධයෙකු බවට පත් වූ අතර ක්‍රමයෙන් රාජ්‍යත්වය සහ බුදුසසුන අතර ගොඩනැඟුණේ සමීප සබඳතාවකි. මෙකී ඓතිහාසික ක්‍රියාවලියේ ප්‍රතිඵලය වූයේ ලංකාවේ පාලකයා අනිවාර්යයෙන්ම බෞද්ධයෙකු වීම සහ බෞද්ධ පාලන ප්‍රතිපත්තිවලට අනුකූලව රාජ්‍ය පාලනය සිදුකිරීමට බැඳී සිටීමයි(ගුණවර්ධන, 1993). මෙරට රාජ්‍යත්වය ස්ථාපනය කරනු ලැබූ විජය රජුට (ක්‍රි.පූ. 543-505) අනුශාසනා කිරීමේ කාර්යයේ යෙදී සිටියේ රජුගේ ප්‍රධාන අමාත්‍යවරයා මෙන්ම පුරෝහිතයා ද වූ උපතිස්ස නම් බ්‍රාහ්මණයා ය. එම තත්ත්වය මහින්දාගමනය සිදු වූ කාලය දක්වාම පැවති බව පෙනෙන්නේ දෙවනපෑතිස් රජුගේ රාජසභාවේ ද තාලිපබ්බත නම් බ්‍රාහ්මණයා සේවය කළ බව වංසකතා දක්වන හෙයිනි (*මහාවංසො*, 2006). එහෙත් බුදු සසුන මෙරට ප්‍රතිෂ්ඨාපනය වීමත් සමග රජුගේ අනුශාසකයා වශයෙන් බ්‍රාහ්මණයන්ට පැවරුණු කාර්යය හිමිකරගත්තේ බෞද්ධ භික්ෂූන් වහන්සේ ය. කල්යත්ම භික්ෂූන් වහන්සේ රාජ්‍ය දේශපාලනය තුළ විශාල අධිකාරී බලයක් වර්ධනය කරගත්තේ ද යන වග විටෙක රජුන් තැනීමට මෙන්ම විටෙක රජුන් විනාශ කිරීමට ද නොපසුබට වීමෙන් පැහැදිලි වේ (ගුණවර්ධන, 1993).

මේ තත්ත්වය අනුරාධපුර රාජධානි සමයේ පටන් උඩරට රාජධානි සමය දක්වා අඛණ්ඩව පැවතියේ ය. උඩරට රාජධානි සමයේදී රජුට පමණක් හිමි වූ වරප්‍රසාද හා ගරු සැලකිලි භික්ෂූන් වහන්සේට ද හිමිව තිබූ බවඋඩරට රජුගේ සිරකරුවෙකුව රැඳී සිටි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් විසින් රචනා කරන ලද *An Historical Relation of Island Ceylon* නම් ග්‍රන්ථයේ දැක්වේ (Knox,1981). උඩරට රාජධානියේ අවසානය සනිටුහන් කෙරුණු ශ්‍රී වික්‍රම රාජසිංහ (1798-1815) සමයතුළ ද ඒ තත්ත්වය එයාකාරයෙන්ම පැවති බව වර්ෂ 1802 දී උඩරටට පැමිණ ඉංග්‍රීසි ජාතික රොබට් පර්සිවල්ගේ *An Account of the Island of Ceylon*නම් කෘතියට අනුව පෙනේ. පර්සිවල් දක්වන අන්දමට ලංකා සමාජය තුළ සියල්ලන්ටම වඩා ඉහළින් සළකන ලද්දේ භික්ෂූන් වහන්සේට ය. භික්ෂූන් වහන්සේ සතු වූ බලය කෙතෙක් වී ද යත් කන්ද උඩරට රාජධානියේ ඉහළම තත්ත්වයේ පසු වූ රජුට පවා භික්ෂූන් වහන්සේගෙන් උපදෙස් ලබාගැනීමට සිදුවිය. මෙනිසා රජු විසින් භික්ෂූන් වහන්සේ විෂයෙහි

***ISBN 978-955-4563-72-8***

පුදසත්කාර කර ඇත්තේ උන්වහන්සේගේ සිත් දිනාගනිමින් කටයුතු කිරීම සඳහා ය. විටෙක රජුට එරෙහිව සටන් කිරීම සඳහා රටවැසියා පෙළඹවීම පවා භික්ෂූන් වහන්සේ විසින් සිදු කළ ද, රාජද්‍රෝහී වරදට උන්වහන්සේට මරණ දණ්ඩනය නියම කිරීමට රජුට නොහැකි බව පර්සිවල් සඳහන් කරයි (Percival, 1803).

එහෙත් පර්සිවල් අවසානයට දක්වන කරුණට එකඟ විය නොහැකි අවස්ථා කීපයක්ම කන්ද උඩරට ඉතිහාසය පිරික්සීමේදී දැකගත හැකිය. මීට උදාහරණ ලෙස දෙවන රාජසිංහ රජුට (1635-1687) එරෙහි කැරැල්ලකට නායකත්වය ලබාදුන් භික්ෂූන් වහන්සේ රජුගේ අණින් හිසගසා දැමුණු බවට නොක්ස් දක්වන සඳහන පෙන්වා දිය හැකිය(Knox,1981). එසේම සබරගමුවේ කැරැල්ලට සම්බන්ධ වීමේ චෝදනාව මත භික්ෂූන් වහන්සේ පිරිසක් සිරගත කිරීමටත්, පරණතලා උන්නාන්සේ නම් භික්ෂුව මරාදැමීමටත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කටයුතු කර තිබේ (De Silva,1953). මෙනිසා රාජද්‍රෝහීවීමේ අවස්ථාවකදී හැරෙන්නට අනෙක් සෑම අවස්ථාවකදීම රජුට පවා අත තැබිය නොහැකි ගෞරවනීය ස්ථානයක් උඩරට රාජධානිය තුළ භික්ෂූන් වහන්සේ සතුවිය.

### ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ශාසනික ප්‍රතිපත්තිය

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ශාසනික ප්‍රතිපත්තිය පිළිබඳ සලකා බැලීමේදී එය සකස්වීමෙහිලා රජුගේ කුඩා අවධියේ පරිසරය ප්‍රබලව බලපෑ බව පෙනෙන්නට තිබේ. කුඩා කන්නසාමි කුමරු මල්වතු විහාරයේ වැඩ වාසය කළ මොරතොට ධම්මක්ඛන්ධ සහ කොබ්බෑකඩුවේ සිරිනිවාස යන වියත් නාහිමිවරුන් සෙවණේ අධ්‍යාපනය හදාළ අතර ක්‍රමයෙන් උන්වහන්සේ සහ කුමරු අතර සමීප සබඳතාවක් ගොඩනැගී තිබූ බව කියවේ (සිල්වා, 1963).

කන්නසාමි කුමරු සිහසුනට පත්වූ පසුව ද එකී සමීප ඇසුර අඛණ්ඩව පැවතුණි. ඒ බව එවකට ඉංග්‍රීසි ආණ්ඩුකාර ෆ්‍රෙඩ්රික් නෝර්ත් විසින් වර්ෂ 1800 අගෝස්තු 4 වනදා ඉන්දියාවේ අග්‍රාණ්ඩුකාර වෙලස්ලි වංශාධිපතිට යැවූ ලිපියෙන් තහවුරු වේ. මල්වතු මහානායක මොරතොට ධම්මක්ඛන්ධ නාහිමි ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ දැඩි ගෞරවයට පාත්‍ර වූ භික්ෂුවක් බව නෝර්ත් එහිදී සඳහන් කරයි. එපමණක් නොව අවශ්‍ය විටෙක රජු බැහැදැකීමේ අවසරය හිමි උන්වහන්සේගේ මාර්ගයෙන් රජු සමග මිත්‍රත්වයක් ඇතිකරගැනීමට තමා අපේක්ෂා කරන බව එම ලිපියෙන් නෝර්ත් වැඩිදුරටත් දන්වා සිටියි (විමලානන්ද, 1967). මොරතොට ධම්මක්ඛන්ධ මහනාහිමියන්ගේ දිනපොතේ ද රජු උන්වහන්සේ බැහැදැකීම සඳහා විහාරයට පැමිණි අවස්ථා කීපයක් පිළිබඳවම සඳහන් වේ(*මොරතොට දිනපොත*,2006). උන්වහන්සේ රජුගේ ගුරුවරයෙකු වීම සහ පසුව රජුගේ අනුශාසකයෙකු වශයෙන් කටයුතු කළ හෙයින් "රාජගුරු" නමින් හැඳින්වුණු බව සැලව ලිපියේ දැක්වේ (ධම්මානන්ද හිමි, 1969).

එලෙස භික්ෂූන් වහන්සේ සමග සමීප සබඳතාවක් පැවැත්වූ රජු විසින් අනුගමනය කළ ශාසනික ප්‍රතිපත්ති පිළිබඳ විමසීමේදී අධ්‍යයනයේ පහසුව තකා,

- දළදා වහන්සේට කරන ලද පුද සත්කාර
- වෙහෙර විහාර පිළිසකර කිරීම සහ ගම්වර පිදීම
- භික්ෂූන් වහන්සේගේ හැකියාවන් අගය කිරීම
- ශාසනික ගැටළු විසඳීම

යන අංශ ඔස්සේ විග්‍රහ කළ හැකිය.

### දළදා වහන්සේට කරන ලද පුද සත්කාර

හේමමාලා සහ දන්ත යුවළ විසින් දළදා වහන්සේ කලිඟු රට සිට මෙරටට වැඩම කරවනු ලැබුවේ අනුරාධපුර රාජධානි සමයේ කිත්සිරිමෙවන් රජ දවස (304-332) ය. ඒ අවස්ථාවේදී කිත්සිරිමෙවන් රජු විසින් ලංකා රාජ්‍යයෙන් දළදාව පුදනු ලැබූ බව මූලාශ්‍රය සඳහන් කරයි (*දළදා සිරිත*, 2000). කල්යත්ම "ලක්දිව සිහසුන් දරන්නා භාරයේ දළදාව තිබිය යුතුය" යන සංකල්පය තහවුරු වීමත් සමග ලාංකේය රාජ්‍යත්වයේ සංකේතය වශයෙන් සලකන ලද්දේ දළදා වහන්සේ ය (*මහාවංශය-දෙවන කොටස*, 1996). මෙනිසා ලක්දිව සිහසුනට පත් සෑම පාලකයෙකුම පාහේ දළදා වහන්සේ උදෙසා අනේකවිධ පුදසත්කාර කළ බව පෙනේ (*දළදා සිරිත*, 2000). ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ද පෙර සිරිත් අනුව යමින් දළදා වහන්සේ උදෙසා පුද සිරිත් නොකඩවා සිදුකළ බව සමකාලීන

*ISBN 978-955-4563-72-8*

ලේඛනයක් වන *දළදා විත්තිය* සඳහන් කරයි. රජු විසින් දළදා ප්‍රදර්ශනයක් පැවැත්වූ අවස්ථාවකදී සිරකරුවන් නිදහස් කිරීමක් ද සිදු කළබව එහි දක්වේ. දළදා වහන්සේට කරන ගරුකිරීමක් වශයෙන් රජු විසින් මෙම සිරකරුවන් නිදහස් කරන්නට ඇත. මෙලෙස නිදහස ලැබූවන් හට ඔවුන් සිරගතවීමට පෙර හිමිව තිබූ ඉඩකඩම් නැවත පවරා දී ජීවනෝපාය සලසා දීමට ද රජු පියවර ගත් බව *දළදා විත්තියේ* වැඩිදුරටත් සඳහන් වේ (*දළදා විත්තිය*, 1974). දළදා වහන්සේගේ ආරක්ෂාව පිළිබඳ රජු සැලකිලිමත් වූ බව පෙනීයන්නේ උඩරටට එල්ල වූ ඉංග්‍රීසි ආක්‍රමණ හමුවේ දළදා වහන්සේගේ රැකවරණය උදෙසා රජු විසින් විශේෂ වැඩපිළිවෙලක් සකසා තිබීම හේතුවෙනි. වර්ෂ 1802 ඉංග්‍රීසි ආක්‍රමණයේදී රජු හඟුරන්කෙත බලා පසුබැසීමට තීරණය කළ අතර දළදා වහන්සේගේ ආරක්ෂාව උදෙසා ඒ ආශ්‍රිත විහාර කිහිපයක් තෝරාගෙන තිබුණේ රජු විසිනි. ඒ අනුව කිතුල්පේ, වැගම, මැදපිටිය, වල්ලිවෙල හා හඟුරන්කෙත යන ප්‍රදේශවල පිහිටි විහාර කිහිපයකට වරින්වර වැඩම කරවනු ලැබූ දළදා වහන්සේගේ තේවාව අඛණ්ඩව පැවැත්වීමට අවශ්‍ය පහසුකම් ද රජු විසින් සපයා තිබුණි(*දළදා විත්තිය*, 1974), (*ඉංග්‍රීසි හටන විමර්ශනය*, 2001). එසේම දළදාවහන්සේ උඩරට රාජධානියට වැඩම කරවූ සමයේ පටන් එහි ආරක්ෂාව උදෙසා ඇපකැප වූ අස්ගිරි පාර්ශවයේ භික්ෂූන් වහන්සේලා අතුරින් වාරියපොල සුමංගල අනුනායක හිමියන් දළදා තේවාව සඳහා පත්කරනු ලැබ තිබුණේ ද රජු විසිනි. එසේම දළදා වහන්සේගේ ආරක්ෂාව උදෙසා මැණික් ගලින් සරසන ලද කරඬු දෙකක් ද රජු පූජා කොට තිබුණි (Pieris,1950). රජු විසින් දළදා මාළිගයේ ශිලාමය තොරණක් ඉදිකරවීම සඳහා ද කටයුතු කරනු ලැබූ බව කියවේ (සිල්වා, 1963).

**වෙහෙර විහාර පිළිසකර කිරීම සහ ගම්වර පිදීම**

ලක්දිව බුදු සසුන ප්‍රතිෂ්ඨාපන කරනු ලැබූ මිහිඳු මාහිමියන්ට අතපැන් වත්කොට සඟ සතුකොට පූජා කරන ලද මහමෙවුනා උයන මෙරට ප්‍රථම ආරාම පූජාව වශයෙන් වංසකතා දක්වයි(*මහාවංසො*,2006). එතැන් පටන් ලක්දිව පාලකයන් ඇතුළු බොහෝ දෙනෙකු බුදුසසුන උදෙසා වෙහෙර විහාර ඉදිකරවීම් හා ගම්බිම් පූජා කිරීම් අප්‍රමාණව සිදුකර ඇති බව සාහිත්‍ය මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය තුළින් පැහැදිලි වේ.

පෙර රජුන් අනුව යමින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ද රාජධානිය පුරා විසිරී පැවති වෙහෙර විහාර රාශියක පිළිසකර කිරීම් කරවීම සහ ගම්වර පිදීම් සිදුකළ ආකාරය පිළිබඳ තොරතුරු බහුලව දැකගත හැකිය. බටහිර ජාතීන්ගේ ආක්‍රමණ, කලින් කලට සිදුකළයුතු පිළිසකර කිරීම් සිදු නොකිරීම මෙන්ම නිලධාරීන්ගේ පැවති අකාර්යක්ෂමතාව ආදී හේතූන් මත විහාර රාශියක් ඒ වන විට විනාශ මුඛයට පත්වෙමින් පැවතුණි. රජුගේ අවධානය මේ පිළිබඳ යොමුවීමත් සමග සිහසුනට පත් වසරේ සිටම එබඳු විහාරවල චිරස්ථිතිය සඳහා අවශ්‍ය පියවර ගැනුණු බව පෙනේ. මේ වකවානුවේදී විනාශ මුඛයට පත්ව තිබූ පෙණෙන දියඉන්නේ ගනේලන්ද විහාරය වර්ෂ 1802 දී පිළිසකර කරවන්නට මුල්වූයේ මාවතගම නම් භික්ෂූන් වහන්සේ ය. පසුව උන්වහන්සේ විසින් එම පිනරජුට අනුමෝදන් කළ අවස්ථාවේදී ප්‍රසාදයට පත් රජුඋන්වහන්සේගේප්‍රමුඛ ශිෂ්‍ය පරපුරට ගනේලන්ද විහාරය පූජා කළ බව ගනේලන්ද විහාර තුඩපතේ සඳහන් වේ. එසේම විහාරයේ නඩත්තුව උදෙසා උඩගම නම් ග්‍රාමය ද රජු විසින් පූජා කළ බව එහි වැඩිදුරටත් දක්වේ (ඤාණවිමල හිමි,2001).

කීර්ති ශ්‍රී රාජසිංහ රජු (1747-1782)විසින් පිළිසකර කරවා තිබූ කොණ්ඩදෙණිය විහාරය මේ වකවානුව වනවිට විනාශ මුඛයට පත්ව තිබුණේ ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණ හේතුවෙනි. පසුව එම විහාරයේ පිළිසකර කිරීම් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අනුග්‍රහයෙන් සිදුකොට, රජුගේ සිතුවමක් ද විහාරයට පූජා කරන ලද බව කොණ්ඩදෙනියේ සන්නසේ සඳහන් වේ. රෙදිකඩක අඳින ලද ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ සම්පූර්ණ ප්‍රමාණයේ මෙම සිතුවම තවමත් සුරක්ෂිතව විහාරයේ තබා තිබෙනු දුටු බව පූජ්‍ය නාවුල්ලේ ධම්මානන්ද හිමියෝ සඳහන් කරති (ධම්මානන්ද හිමි,1969). තවත් මෙවැනි අන්දමේ රජුගේ සිතුවමක් වර්ෂ 1804 දී රජු විසින් ප්‍රතිසංස්කරණය කරවනු ලැබූ නියම්ගම්පාය රජමහ විහාරයට පූජා කර තිබේ (Pieris, 1950).

තවද සබරගමුවේ පිහිටි කිරඹ ගල් විහාරයේ කටයුතු සඳහා රජු විසින් ගම් බිම් පූජා කර තිබුණේ රත් සඳුන් අරටුවකින් කරන ලද සන්නසකිනි. එහෙත් පසු කලෙක විහාරය පාලුවට යාම හේතුවෙන් රත් සඳුන් සන්නස විනාශයට පත් වූ බව කියවේ (ඤාණවිමල හිමි,2001). රාජධානියේ සංචාරය කරන විට දරජුගේ විශේෂ අවධානයක් යොමුව තිබුණේ රාජධානියේ පිහිටි වෙහෙර විහාර පිළිබඳව ය. වරක් සුදුහුම්පොළ විහාරයට පැමිණි රජුට ගම්වරයක් නොමැති හෙයින් තමන්වහන්සේලාට මුහුණ දීමට සිදුව තිබෙන දුෂ්කරතා පිළිබඳ පැමිණිලි කරන ලද්දේ විහාරයේ භික්ෂූන් වහන්සේ විසිනි. ඊට විසඳුමක් වශයෙන් මාතලේ කුඹලෝලුව ග්‍රාමය සුදුහුම්පොළ විහාරයට පූජා කළ රජු

*ISBN 978-955-4563-72-8*

විහාරයේ නායක පදවිය මහවත්තේ හිමියන්ට භාර කළ බව කියවේ (Lawrie,1896). මේ හැරෙන්නට රජුගේ සෘජු මැදිහත්වීමෙන් සිදුකරනු ලැබූ වෙහෙර විහාර පිළිසකර කිරීම හා ගම්වර පූජා කිරීම් අතරට බෝගොඩ රජමහ විහාරය පිළිසකර කරවීම (ශ්‍රී.ලං.රා.ලේ., 5/63/142/2), දඹුලු රජමහ විහාරයේ සිතුවම් පිළිසකර කරවීම (ඉලංගසිංහ, 1987), ලංකාතිලක රජමහ විහාරයේ කටයුතු සඳහා ඇරැව්වාවල ග්‍රාමයේ ගොඩමඩ ඉඩම් පූජා කිරීම, බුත්තල යුදගනාපිටිය රජමහ විහාරයේ කටයුතු සඳහා ගම් බිම් පූජා කිරීම, පොත්ගුල් විහාරයේ විහාරාධිපති මිල්ලපිටියේ සීලවංස නාහිමියන්ට කුකුළු කෝරළයේ පල්ලෙත්තුවේ ගලතර ග්‍රාමය පූජා කිරීම සහ මල්වතු අස්ගිරි උභය පාර්ශව භික්ෂූන් වහන්සේ හතළිස් නමක් උදෙසා දිනපතා දන් පිළිගැන්වීට ගම්පොළ කෙත් යායක් වෙන් කරවීම යනාදිය දැක්විය හැකිය (සිල්වා, 1963).

ඉහත සඳහන් කළ ආකාරයට රජු මැදිහත්වීමෙන් සිදුකරන ලද වෙහෙර විහාර පිළිසකර කරවීම් සහ ගම්වර පූජා කිරීම්වලට අමතරව රාජකීය නිලධාරීන් විසින් ද රජුගේ නියෝගවලට අනුව වෙහෙර විහාර පිළිසකර කිරීම් සහ ගම්වර පූජා කිරීම් සිදුකර තිබේ. ඊට උදාහරණ වශයෙන් වර්ෂ 1798 දී රජුගේ නියෝගයෙන් දුම්බර නිලමේ විසින් මාරගල විහාරයේ වැඩ විසූ වේපතඉර හිමියන්ට සබරගමු දිසාවේ අටකලන් කෝරළේ නිලතුරේ ග්‍රාමය පූජා කළ බව සඳහන් මාරගල විහාර තුඩපත දැක්විය හැකිය (ඤාණවිමල හිමි,2001).තවද වර්ෂ 1806 දී රජුගේ අණ පරිදි පිළිමතලව්වේ මහාදිකාරම් විසින් ඇත්තලවත්තේ විහාරයේ වැඩ විසූ පාලටුවේ සෝභිත හිමියන්ට සබරගමු දිසාවේ අටකලන් කෝරළයේ පහළඥුමාදම්පේ නම් ග්‍රාමය පූජා කළ බව සඳහන් වන ඇත්තලවත්තේ විහාර තුඩපත ද මීට නිදසුනකි (ධම්මානන්ද හිමි,1969).

එසේම තම නිලධාරීන් විසින් ස්වාධීනව සිදුකරන ලද වෙහෙර විහාර පිළිසකර කරවීම් උදෙසා ද රජුගේ අනුග්‍රහය හිමිව තිබේ. මීට නිදසුනක් වන්නේ රජුගේ පළමු අදිකාරම් වූ පිළිමතලව්වේ මහනිළමේ විසින් කරවන ලද අස්ගිරි විජයසුන්දාරාම නව විහාරයට රජු විසින් සිදුකළ ගම්වර පූජාවයි.දිගු කලක පටන් අස්ගිරි විජයසුන්දරාරාම මහාවිහාරයේ කටයුතු සඳහා අනුග්‍රහ දක්වමින් එහි විහාර කර්මාන්ත කරවා තිබුණේ පිළිමතලව්වේ පරපුරේ සාමාජිකයන් විසිනි. ඒ අනුව යමින් පිළිමතලව්වේ මහනිළමේ විසින් බුද්ධ ප්‍රතිමා, දේව ප්‍රතිමා සහ සිතුවම් සහිත නව විහාර මන්දිරයක් ඉදි කරවන්නට යෙදුණි. උඩ විහාරය නමින් ප්‍රකට වුණු එම විහාරයේ නේත්‍රා ප්‍රතිෂ්ඨාපන මංගල්‍යය සඳහා පිළිමතලව්වේ මහනිළමේගේ ආරාධනයෙන් මව් බිසව හා බිසෝවරුන් සමග රජු පැමිණ තිබේ. එහිදී නව විහාර කර්මාන්තය පිළිබඳ ප්‍රසාදයට පත් රජු සහ මව් බිසව සාරසිය පත්තුවේ කහවත්ත සහ මාතලේ දිසාවේ අස්ගිරි කෝරයේ අස්ගිරි යන ගම් අස්ගිරි මහාවිහාරයේ කටයුතු උදෙසා පූජා කළ බව අස්ගිරි අලුත් විහාර ලිපියේ සඳහන් වේ (ධම්මානන්ද හිමි,1969). මෙම ගම්වර පූජාව පිළිබඳ සඳහන් තල්පත විහාර බුද්ධ ප්‍රතිමාව ඉදිරියේ තැන්පත් කළ රජු එය විහාරයේ ගල් පර්වතයක කෙටවීමට නියෝග කර තිබේ. දෙපෝයකින් අනතුරුව නැවත පැමිණි රජු ශිලා ලේඛනය නිවැරදි කොටා ඇති අන්දම පිළිබඳ සතුටුව එයට දායක වූ ශිල්පීන්ට රජවාසළ මහ අරමුදලින් ගෙවීම් සිදුකිරීමට නියම කළ බව කියවේ (Lawrie,1896).

රජු සහ රාජකීය නිලධාරීන්ට අමතරව මේ වකවානුවේදී භික්ෂූන් වහන්සේ පවා වෙහෙර විහාර පිළිසකර කිරීම සඳහා යොමුව සිටි පෙනේ. උන්වහන්සේලාගේ එම කටයුතු සඳහා රජුගේ අනුග්‍රහය ද හිමිව තිබුණි. එවැනි භික්ෂූන් අතුරින් රාජගුරු මොරතොට ධම්මක්ඛන්ධ මහනාහිමියන් ප්‍රධාන ය. උන්වහන්සේගේ මූලිකත්වයෙන් පිළිසකර කෙරුණු විහාරය වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස ඉදිකරනු ලැබූ සැලව රජමහ විහාරයයි. ධම්මක්ඛන්ධ මහනාහිමියන් විසින් විහාරයේ පිළිසකර කිරීම් නිමකොට ඒ බව දන්වනු ලැබූ අවස්ථාවේදී රජු පැමිණ පැමිණ විහාර කර්මාන්තය පිළිබඳ ප්‍රසාදයට පත්ව ගම්වර පූජා කළ බව කියවේ. එහිදී සැලව ග්‍රාමය ඇතුළුව දෙබජ්ජම, කිතුල්වත්තදෙණිය, කිඳිගොඩ කෝරළයේ වල්ගම්පත්තුවේ ඉලුක්තැන්නේ බෝගහකුඹුර ආදී ප්‍රදේශවල ගොඩ මඩ ඉඩම් රාශියක් රජු විසින් විහාරයට පූජා කළබව විහාරයේ පිහිටවූ සෙල්ලිපියේ සඳහන් වේ. ලක්දිව රජතුමෙකු විසින් පිහිටුවන ලද අවසන් සෙල්ලිපිය වන්නේ ද මෙම සෙල්ලිපිය බව පිළිගැනේ (ධම්මානන්ද හිමි,1969).

වර්ෂ 1808 දී නව විහාර කර්මාන්ත කරවා එහි පින් රජතුමාට අනුමෝදන් කරවීමට කොට්ටඉඹුල්වල අනෝමදස්සී නම් භික්ෂූන් වහන්සේ විසින් කටයුතු කර තිබුණි. එම අවස්ථාවේදී ප්‍රසාදයට පත් වූ රජු අක්කර පසළොස් දහසකට නොඅඩු ගොඩ මඩ ඉඩම් ප්‍රමාණයක් උන්වහන්සේගේ භාරකාරීත්වය යටතේ පැවති කොට්ටඉඹුල්වල රජමහ විහාරයට සහ අරමණපොල රජමහ විහාරයට පූජා කළ බව කොට්ටඉඹුල්වල විහාර තඹ සන්නස සඳහන් වේ (ඤාණවිමල හිමි, 2001). මේ හැරෙන්නට වර්ෂ 1809 දී වැලිගම අග්‍රබෝධි විහාරය සහ එම විහාර සංඝයේ සෑම විහාරයකම සිදුකරනු ලැබූ පින්කම්

*ISBN 978-955-4563-72-8*

සියල්ලම රජුට අනුමෝදන් කර තිබෙන බව පුණ්‍යානුමෝදනා පත්‍රයක දැකගත හැකිය. ඒ පිළිබඳව ද රජු ප්‍රසාදයට පත්වන්නට ඇතැයි සිතිය හැකි නමුත් රජු විසින් එම විහාර සංඝයට සිදුකරන ලද ගම්වර පූජාකිරීමක් පිළිබඳ තොරතුරු හමු නොවේ. මෙම පුණ්‍යානුමෝදනා පත්‍රය විශේෂ වන්නේ මේ සියලු පින්කම්වල ආනුභාවයෙන් රජුට බුදු බව ප්‍රාර්ථනා කිරීමට ලේඛකයා අවසානයේදී කටයුතු කර තිබීම හේතුවෙනි (වනරතන හිමි, 2008).

### භික්ෂූන් වහන්සේගේ හැකියාවන් අගය කිරීම

බුදු සසුන සහ රාජ්‍යත්වය අතර පවතින සමීප සබඳතාව යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාහැකි වන්නේ භික්ෂුව සහ රජු අතර හිතවත්බවක් පැවතියහොත් පමණි. එහිදී වෙහෙර විහාර පිළිසකර කරවීම සහ ගම්වර පූජා කරවීමට අමතරව උන්වහන්සේලාගේ දක්ෂතා අගය කිරීමෙන් ද එකී හිතවත්බව පවත්වාගෙන යාමට ලක්දිව පාලකයන් කටයුතු කර තිබේ. මෙනිසා භික්ෂූන් වහන්සේ ද තමන්වහන්සේලාගේ දක්ෂතා ප්‍රකට කරවමින් රජුගේ ප්‍රසාදයට පාත්‍රවීමට ප්‍රිය කළ බව පෙනේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ සමය තුළ ද මේ තත්ත්වය සුලබව දැකගත හැකිය.

කරඳන දේවරක්ඛිත හිමියන්ට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් දුම්බර කීරගම ග්‍රාමය පූජා කරනු ලැබීම මීට නිදසුනකි. එවකට මල්වතු මහානායක මොරතොට ධම්මක්ඛන්ධ නාහිමියන් සහ කරඳන දේවරක්ඛිත හිමියන් අතර පැවතියේ කුළුපග සම්බන්ධතාවකි. උන්වහන්සේලා අතර නිතර හසුන්පත් හුවමාරු වුණු අතර දිනක් මහනාහිමියන් බැහැදැකීමට පැමිණි රජුට කරඳන දේවරක්ඛිත හිමියන් එවූ හසුන්පතක් දැකගැනීමට ලැබිණි. උන්වහන්සේගේ අක්ෂරවල තිබූ අලංකාර භාවය පිළිබඳ ප්‍රසාදයට පත් රජුගේ අපේක්ෂාව වූයේ එම අකුරුවලින් තමන්ට ධර්ම ග්‍රන්ථයක් ලියවාගැනීමට ය. ඒ බව දන්වීමත් සමග දේවරක්ඛිත හිමියන් විසින් සම්පූර්ණ මැඳුම් සඟිය පුස්කොළ පොතක ලියා රජුට පිළිගන්වන ලදී. ඉන් අතිශය ප්‍රසාදයට පත් රජු උන්වහන්සේට අවශ්‍ය කුමක්දැයි විමසූ අවස්ථාවේදී දේවරක්ඛිත හිමියන්ගේ පිළිතුර වූයේ මියන කොළ මිටක් කඩාගැනීම සඳහා දුම්බර කීරගම ලැබුණොත් යහපත් යන්නයි. ඒ අනුව ප්‍රමාණයෙන් අක්කර අටදහස් තුන්සිය පහක් පමණ වූ දුම්බර කීරගම ග්‍රාමය රජු විසින් උන්වහන්සේට පූජා කළ බව වර්ෂ 1801 දී නිකුත් කරන ලද නැඳුන් විහාර තුඩපතේ සඳහන් වේ (ඥාණවිමල හිමි,2001).

මේ හැරෙන්නට වර්ෂ 1812 දී ඇහැලේපොළ මහ නිළමේ සිදුකළ පින්කමක් වර්ණනා කරමින් අක්මීමන සිරිධම්ම නම් තරුණ භික්ෂූන් වහන්සේ විසින් කළ පාලි ප්‍රබන්ධය රජු අතට ද පත්ව තිබුණි. එහි සාරගර්භ බව පිළිබඳ පැහැදුණු රජු බාල වියේ පසු වූ භික්ෂුවක් එබඳු උසස් ප්‍රබන්ධයක් කිරීම පසසමින්සිරිධම්ම හිමියන්ට සබරගමු දිසාවේ අටකලන් කෝරළයේ රණබාහුගම නම් වූ අක්කර 400 ක ප්‍රමාණයක් සහිත ග්‍රාමය පූජා කළ බව කියවේ (වීරසූරිය,2008). තවත් වරෙක රජවාසළ ධර්ම දේශනා පැවැත්වීම සඳහා වැඩම කළ සතර කෝරළයේ වතුරේ බුද්ධරක්ඛිත නම් භික්ෂූන් වහන්සේගේ ව්‍යක්ත ධර්ම කථික බව පිළිබඳ රජු පැහැදීමට පත්විය. පසුව උන්වහන්සේ අගය කරමින් රන් පත්හිඳක් සහ උන්වහන්සේ වැඩ විසූ වතුරේ රජමහ විහාරයට ඉඩකඩම් ද රජු විසින් පූජා කර තිබේ (යටවර,2005). මේ කාලයේදී රජුට සෙත් පතමින් සහ රජු වර්ණනා කරමින් රජුගේ ප්‍රසාදය ලබාගැනීමට ද භික්ෂූන් වහන්සේලා කටයුතු කළ බව පෙනේ. එකල මල්වතු විහාරයේ වැඩ විසූ පුවක්මොටේ නම් භික්ෂූන් වහන්සේ විසින් ඒ දිනවල රජු මඳක් ගිලන්ව පසු වූ හෙයින් සෙත් කවියක් රචනාකොට නිරෝගී සුව පැතීමට කටයුතු කර තිබුණි. එහෙත් උන්වහන්සේගේ සතුරෙකු විසින් රජුට ඒ පිළිබඳ කරුණු විකෘති කොට සැලකිරීම හේතුවෙන් *පුවක්මොටේ බලි ශාන්තිය* නමින් කාව්‍ය ප්‍රබන්ධයක් කළ පුවක්මොටේ හිමියෝ එයින් නැවතත් රජුට සෙත් පැතීමට කටයුතු කළහ. අවසානයේදී එම කාව්‍ය ප්‍රබන්ධය රජුට ඔප්පු කළ අවස්ථාවේදී ප්‍රසාදයට පත් රජු පුවක්මොටේ හිමියන්ට ගම්වරයක් පූජා කළ බව කියවේ (සිල්වා, 1963). මේ හැරෙන්නට රජු වර්ණනා කරමින් පාගාවැවේ හිමියන් විසින් ප්‍රබන්ධ කළ*ශ්‍රී වික්‍රමඅලංකාරය* නමින් කාව්‍ය ප්‍රබන්ධයක් හමුවේ. පාගාවැවේ හිමියන්ගේ අරමුණු වී තිබුණේ එවකට විනාශමුඛයට පත්ව තිබූ අනුරාධපුර ථූපාරාම දාගැබ පිළිසකර කිරීම සඳහා රාජානුග්‍රහය ලබා ගැනීම ය (ශ්‍රී.ලං.රා.ලේ., 5/63/100/5).

### ශාසනික ගැටළු විසඳීම

බුදු සසුන පිළිබඳ මෙන්ම භික්ෂූන් වහන්සේ සම්බන්ධ ගැටළු ඇතිවූ අවස්ථාවලදී සමයාරක්ෂකයා වශයෙන් රජු මැදිහත් වී එම ගැටළු විසඳීමට කටයුතු කළ බවට අනුරාධපුර යුගයේ පටන් සාධක හමුවේ (මහාවංසො, 2006). විශේෂයෙන්ම සංඝ සංශෝධන, ශාසන කතිකාවත් ආදිය රජුගේ

*ISBN 978-955-4563-72-8*

ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු අතර විටෙක රජුගේ නියමයෙන් ධර්ම විනය පිළිබඳ ව්‍යක්ත රාජ නිලධාරීන් ද ශාසනික ගැටළු විසඳීම සඳහා මැදිහත් වූ බව පෙනේ (මහාවංසො, 2006). උඩරට රාජධානි සමය තුළ ද භික්ෂූන් වහන්සේලා සහ විහාරස්ථාන සම්බන්ධ විවිධ ගැටළු පැනනැඟුණු අවස්ථාවලදී ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසින්ම මැදිහත් වී ඒවා විසඳාලීමට කටයුතු කර තිබෙනු දැකිය හැකිය.

වැලිවිට සරණංකර සඟරජ හිමියන්ගේ ශිෂ්‍යයෙකු වූ කුංකුණාවේ හිමියන් නමින් පතළ රඹුක්වැල්ලේ ධම්මරක්ඛිත හිමියන්ට වැල්ලාගල නම් විහාරය පවරා දී තිබුණේ සඟරජ හිමියන් විසිනි. එහෙත් පසුකලෙක මල්වතු මහානායක මොරොතොට ධම්මක්ඛන්ධ හිමියන් සමග ඇතිකරගත් මතභේදයක ප්‍රතිඵලය වූයේ කුංකුණාවේ හිමියන් වැල්ලාගල විහාරයෙන් පලවා හැරීමයි. විහාරයක් නොමැතිව අසරණ භාවයට පැමිණි කුංකුණාවේ හිමියන් විසින් තමන්වහන්සේ පත්ව ඇති තත්ත්වය පිළිබඳ *වෙහෙර විත්තිය* නම් කාව්‍ය සංග්‍රහය මගින් රජුට දන්වා සිටින ලදී. එයට විසඳුමක් වශයෙන් රජු විසින් අන්නම්පට්ටු විහාරය කුංකුණාවේ හිමියන්ට පූජා කරන ලදී. පසුව එම විහාරයෙන් ද උන්වහන්සේ පළවා හැරීමට ගත් වෑයම ව්‍යර්ථ කිරීමට කුංකුණාවේ හිමියන්ට හැකිවූයේ රජුගේ ආධාරයෙනි. මෙලෙස තමන්වහන්සේට රජු දැක්වූ අනුග්‍රහය පිළිබඳ සතුටට පත් කුංකුණාවේ හිමියන් විසින් *රාම සන්දේශය* නම් ගාථා 65 කින් සමන්විත පාලි කාව්‍ය සංග්‍රහය රචනා කොට හඟුරන්කෙත දේවාලයේ රාම දෙවියන්ගේ ආශිර්වාදය රජුට ප්‍රාර්ථනා කර තිබේ (*සරසවිය 6 කලාපය*, 1969). විටෙක රාජ නිලධාරීන් අතින් භික්ෂූන් වහන්සේට සහ බුදුසසුනට සිදුවන අකටයුතුකම් නිවැරදි කරවීමට ද රජු පියවර ගෙන තිබුණි. එවකට සබරගමු දිසාවේ අටකලන් කෝරළයේ ප්‍රාදේශීය නිලධාරියෙකු වශයෙන් කටයුතු කළ මාකඳුරේ මොහොට්ටාල විසින් ගනේගොඩ විහාරයේ කටයුතු සඳහා පූජාකොට තිබූ ඉඩම් යොදාගෙන තිබුණේ ස්වකීය පුද්ගලික කටයුතු උදෙසා ය. මේ පිළිබඳ රජුගේ අවධානය යොමුවීමත් සමග වර්ෂ 1807 දී නැවතත් එම ඉඩම් විහාරයට පවරා දීමට රජු විසින් කටයුතු කර තිබේ (ඤාණවිමල හිමි,1967).

තවද රාජාධිරාජසිංහ රජු විසින් කෙවුල්ගම සන්නසෙන් රඹුක්වැල්ලේ රතනජෝති නම් භික්ෂූන් වහන්සේට පූජාකරනු ලැබූ කෙවුල්ගම විහාරය පසුව පිළිමතලව්වේ මහාදිකාරම්ගේ අභිමතය පරිදි පවරා දී තිබුණේ මැණික්දිවෙල හිමියන්ටය. මේ පිළිබඳවරජුගේ අවධානයට යොමු කරන ලද්දේ යටිනුවර රාළ නම් කොඩිතුවක්කු නිළමේ විසිනි. උඩරටට එල්ල වූ ඉංග්‍රීසි ආක්‍රමණය හේතුවෙන් හඟුරන්කෙත මාළිගාවේ රැඳී සිටි රජු මේ පිළිබඳ අවධානය යොමු කොට නැවතත් රඹුක්වැල්ලේ හිමියන්ට කෙවුල්ගම විහාරයට පවරා දීමට නියෝග කළේ පිළිමතලව්වේ මහාදිකාරම්ට තරවටු කරමිනි. එපමණක් නොව සටන් නිමාවීමත් සමග කෙවුල්ගම විහාරයට පැමිණ තමාගේ නියෝගය නිසි පරිදි ක්‍රියාත්මක වූයේදැයි සොයාබැලීමට පවා රජු කටයුතු කළ බව කියවේ (Lawrie,1896). රාජධානිය තුළ යුදමය තත්ත්වයක් පැවතිය ද, සමයාරක්ෂකයා වශයෙන් තමාගෙන් ඉටුවිය යුතු වගකීම් හා යුතුකම් නොපිරිහෙලා ඉටුකිරීමට රජු සෑම විටම උත්සහ ගත් බව මින් පැහැදිලි වේ.

සාමාන්‍ය ජනතාව අතින් වුව ද භික්ෂූන් වහන්සේට සිදුවූ අකටයුතුකම් පිළිබඳ රජුගේ අවධානය යොමුව තිබේ. වරක් ධර්ම ලේඛනයක බරපැන වශයෙන් මැද්දේගම ධම්මරක්ඛිත නම් හිමියන්ට ඉඩමක් පූජා කළ අලුත්ගේ උපාසක නයිදේ නම් පුද්ගලයා විසින් පසුව ඇතිවූ අමනාපයකින් නැවත එම ඉඩම පූජා කරන ලද්දේ දළදා වහන්සේට ය. සාංඝික දේපළක් නැවතත් පුද්ගලික පරිහරණයට ගත නොහැකි හෙයින් එකී ඉඩම ධම්මරක්ඛිත හිමියන්ට අහිමිකරවීමේ අරමුණින් දළදා වහන්සේට පූජා කිරීමට අලුත්ගේ උපාසක නයිදේ කටයුතු කළ බව පැහැදිලි ය. එහෙත් මේ පිළිබඳ ධම්මරක්ඛිත හිමියන් විසින් රජුට පැමිණිලි කිරීමත් සමග සිද්ධිය විමසා බැලූ රජු එකී ඉඩම නැවතත් ධම්මරක්ඛිත හිමියන්ටම පවරා දුන් බව තුඩපතකින් අනාවරණය වේ (ඤාණවිමල හිමි,1967).

මේ හැරෙන්නට පොදුවේ ශාසනය සම්බන්ධ අර්බුදයන්හිදී රජු අවසන් තීරකයා වූ බව හැඟවෙන සිදුවීම් කිහිපයක් ද දැකගත හැකිය. වර්ෂ 1753 දී පිහිටවනු ලැබූ සියම් උපසම්පදාව කාලයත් සමගම ගොවිකුල වංශියන්ට පමණක් සීමා වීම හේතුවෙන් අන් කුලවලට අයත් සාමණේරවරුන් පත්වූයේ බලවත් අපහසුතාවකට ය(*මන්දාරම්පුර පුවත*, 1958). මෙනිසා සියම් උපසම්පදාව ගොවිකුල නොවන සාමණේරවරුන්ට ද ලබාගැනීමේ අරමුණින්සඳහා රජුගේ මැදිහත්වීම අපේක්ෂා අයදිමින් මිහිරිපැන්නේ ධම්මරතන නම් සාමණේරයන් විසින් සිංහල සිලෝ ප්‍රබන්ධයක් රචනා කරන ලදී. කෙසේ වෙතත් පැවති දේශපාලන හා ආගමික වාතාවරණය අනුව එය ඉටුකරදීමට රජුට හැකියාවක් නොවූ බව පෙනේ (වීරසූරිය, 2008).

වර්ෂ 1800 දී පමණ පහතරට විහාරයක් පිළිබඳ ගැටළුවක් රජු විභාග කළ අවස්ථාව තවත් වැදගත් සිදුවීමකි. පහතරට ප්‍රදේශයේ තැනුම්පොත නම් විහාරය සම්බන්ධව ඇතිවුණු ගැටළුවකදී එය

***ISBN 978-955-4563-72-8***

විසඳාලීමට මැදිහත් වූ මල්වතු මහනායක මොරතොට ධම්මක්ඛන්ධ නාහිමියන් විසින් උඩපාත දෙරට භික්ෂු නියෝජිත මණ්ඩලයක් ඉදිරියේ ප්‍රශ්නය විභාග කොට තීන්දුවක් ලබා දී තිබුණි. එහෙත් එම තීන්දුව හිරිඹුරේ ආනන්ද නම් භික්ෂූන් වහන්සේ නොපිළිගත් හෙයින් ගැටළුව ප්‍රදේශයේ ඉංග්‍රීසි අධිකරණයට යොමුකිරීමට සිදුවිය. එයින් ද පෙර තීන්දුවම තහවුරු වූ නිසා මෙම ගැටළුව විසඳාගැනීට තැනුම්පොත විහාරයේ දායකයන් විසින් අභියාචනා කරන ලද්දේ කන්ද උඩරට රජතුමාට ය (වනරතන හිමි,2008). මේ සිදුවීම වැදගත් වන්නේ තැනුම්පොත විහාරය පහතරට ඉංග්‍රීසි පාලන ප්‍රදේශයේ පිහිටා තිබුණ ද, බුදුසසුන සම්බන්ධ ගැටළුවකදී කන්ද උඩරට රජුගේ විනිශ්චය අවසන් විනිශ්චය වශයෙන් පහතරට ජනතාව පවා පිළිගෙන තිබූ බවමින් තහවුරු වන හෙයිනි. ඒ නිසා දේශපාලනික අතින් රට බෙදී පැවතිය ද, ආගමික අතින් එක්සේසත් බවක් පවත්වා ගෙන යාමට කන්ද උඩරට රජවරුන්ට හැකි වූ බව ශ්‍රී වික්‍රම රාජසිංහ රජ සමයේදී වාර්තා වන මෙම සිදුවීමෙන් පැහැදිලි වේ.

## නිගමනය

ප්‍රධාන වශයෙන් අංශ හතරක් ඔස්සේ ඉදිරිපත් කෙරුණු කරුණුවලට අනුව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් විටෙක සිංහල රජුන් පවා පරයන අන්දමේ ශාසනික සේවා ඉටුකරන ලද බව පෙනෙන්නට තිබේ. පෙර සඳහන් කළ අන්දමට ලක්දිව පාලකයා බෞද්ධයෙකු වීම හා බෞද්ධ ප්‍රතිපත්තිවලට අනුකූලව පාලනය ගෙනයාමට බැඳීසිටීම යන සම්ප්‍රදාය හේතුකොටගෙන රජු එසේ සිදුකරන්නට ඇතැයි පැවසිය හැකි වුව ද, ඊට වඩා පුළුල් හේතු කිහිපයක් පසුබිමෙහි වූ බව පැහැදිලි ය. රජකමට උරුමකම් තිබූ මුත්තුසාමි කුමරු පරයා සිහසුන හිමිකරගැනීමට සමත් වුව ද, රාජ උරුමය පිළිබඳ ගැටළුව ශ්‍රී වික්‍රම රාජසිංහට නිරන්තර අභියෝගයක් විය. එසේම කන්ද උඩරට රාජ්‍යත්වය රඳා පැවති ව්‍යුහය ද සඳහා බලපෑමක් කරන්නට ඇත. කන්ද උඩරට රාජධානිය දරා සිටි කුළුණු ලෙස හඳුනාගත හැක්කේ භික්ෂූන්, රදළයන් හා සාමාන්‍ය ජනතාව ය. ඒ අනුව භික්ෂූන්ගේ පක්ෂපාතීත්වය හිමිකරගැනීම අනෙක් දෙකොට්ඨාසයේම පක්ෂපාතීත්වය තහවුරු කරගැනීමේ මාර්ගය වී තිබුණි. මෙනිසා රජුගේ ශාසනික සේවයට එය ද බලපා ඇති බව සිතිය හැකිය. ශ්‍රී වික්‍රම රාජසිංහ සිහසුන් පැමිණි තැන් පටන් අනුගමනය කළ ප්‍රතිපත්තියක් වූයේ රදළ බලය බිඳ දැමීම කටයුතු කිරීම ය. ඒ හේතුවෙන් මතුවිය හැකි රදළ විරෝධය මර්දනය කිරීමේ එක් උපායක් ලෙස ද රජුගේ ශාසනික සේවය මෙන්ම රදළයන්ගේ ශාසනික කටයුතු උදෙසා රාජානුග්‍රහ දැක්වීම හඳුනාගත හැකිය. අනෙක් අතට බුදුසසුනට අනුග්‍රහ දක්වන පාලකයන් සැමවිටම ජනතාවගේ සිත් දිනාගනු ලැබූ හෙයින් රදළයන් තමාට එරෙහි වුව ද, භික්ෂූන් සහ ජනතාව තමා පිළිගනු ඇතැයි රජු විශ්වාසය කරන්නට ඇත.එහෙත් ශාසනික ප්‍රතිපත්ති උපයෝගී කොටගනිමින් ස්ථාවර පාලනයක් පවත්වාගැනීමේ රජුගේ සැලසුම ව්‍යර්ථ වූයේ රදළයන් රජුට එරෙහි වීමත්, ඒ අනුව යමින් භික්ෂූන් වහන්සේ සහ ජනතාව ද රජුට එරෙහි වීමත් හේතුවෙනි. අවසානයේදී රදළයන්ගේ මූලිකත්වයෙන් වර්ෂ 1815 දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බලයෙන් පහකරන ලද්දේ ඉංග්‍රීසීන්ගේ ද සහයෝගය ඇතිව ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

*ඉංග්‍රීසි හටන විමර්ශනය.* (2001). සරත්, ලයනල් (සංස්.). කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.
ඉලංගසිංහ, මංගල (1987). *දඹුලු විහාරය.* දඹුල්ල: ටී.බී.එම්. දිසානායක.
ගුණවර්ධන, රණවීර (1993).*සිවුර සහ නගුල.* කොළඹ: සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.
ඥාණවිමල හිමි, කිරිඇල්ලේ (1967).*සපරගමු දර්ශන.* රත්නපුරය: ශාස්ත්‍රෝදය මුද්‍රණාලය.
ඥාණවිමල හිමි, කිරිඇල්ලේ (2001).*සපරගමුවේ පැරණි ලියවිලි.* නුගේගොඩ: මානව හිතවාදී ලේඛක පර්ෂදය.
*දළදා විත්තිය.* (1974). සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර (සංස්.). කොළඹ: ලේක්හවුස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය.
*දළදා සිරිත*(2000). ගුණවර්ධන, වී.ඩී.එස්. (සංස්.). කොළඹ: සමයවර්ධන ප්‍රකාශන.
ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1969).*මධ්‍යම ලංකා පුරාවෘත්ත.* කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.
*මන්දාරම්පුරපුවත.* (1958). ලංකානන්ද හිමි, ලබුගම (සංස්.). කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
*මහාවංසො* (2006). ඉලංගසිංහ, මංගල (සංස්.). කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
*මහාවංශය-දෙවන කොටස* (1996). සුමංගල හිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (සංස්.). කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
*මොරතොට දිනපොත.* (2006). යටවර, එම්.ඩී.එම්.එස්. (සංස්.). කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
යටවර, එම්.ඩී.එම්.එස්. (2005).*ඉසුරු බෝ ලත් වතුර සහ කෑගලු ප්‍රවේණිය.* වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.
වජිර හිමි, කුඹුරුගමුවේ (1983).*දළදා ඉතිහාසය සහ සංස්කෘතිය.* කොළඹ: උසස් අධ්‍යාපන

***ISBN 978-955-4563-72-8***

අමාත්‍යාංශය.
වනරතන හිමි, කඹුරුගමුවේ (2008).*රුහුණේ පැරණි අත්ලිපි*. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
වීරසූරිය, පී.ඩී.ඇස්. (2008).*මාතර සාහිත්‍ය වංශය*. කොළඹ: ඇස්.ගොඩගේ සහ සමාගම.
සිල්වා, මේලියස් (1963).*අපේ අන්තිම රජතුමා*. කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.
විමලානන්ද, තෙන්නකෝන් (1967).ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරතුමා, මල්වතු මහ නායක හිමි සහ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු.*ඉතිහාස සඟරාව 1 කලාපය*. නුගේගොඩ: විද්‍යෝදය විශ්වවිද්‍යාලය.
*සරසවිය 6 කලාපය*. (1969).නුගේගොඩ: විද්‍යෝදය විශ්ව විද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමය.
De Silva, Colvin R. (1953).*Ceylon Under the British Occupation Vol I*. Colombo: Colombo Apothecaries’ Co.Ltd.
*Diary of Mr. John D’Oyly* (1995).New Delhi: Navrang.
Knox, Robert (1981).*An Historical Relation of Island Ceylon*. Dehiwala: Tisara Prakasakayo Ltd.
Lawrie, A.C. (1896).*Gazetteer of the Central Provinces of Ceylon Vol I*.Colombo: Government Printers.
Percival, Robert (1803).*An Account of the Island of Ceylon*. London: C & R. Boldwin.
Pieris, P.E. (1950).*Sinhalē and the Patriots*. Colombo: Colombo Apothecaries Company Ltd.
ශ්‍රී ලංකා රාජ්‍ය ලේඛනාගාරය 5/63/100/5- *ශ්‍රී වික්‍රමඅලංකාරය*
ශ්‍රී ලංකා රාජ්‍ය ලේඛනාගාරය 5/63/142/2- නම සඳහන් නොවේ.